*සැ. යු.*- 2019.11.22 දින පළ වූ අංක 2,151 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,152 - 2019 නොවැම්බර් මස 29 වැනි සිකුරාදා - 2019.11.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — | වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — | පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — | පිස්කල් විකිණීම ... ... ... | 726 |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — | බුද්දල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — | නොතාරිස් ලැයිස්තු ... ... ... ... | 727 |
| | | විවිධ දැන්වීම් ... ... ... ... | — |

*සැ. යු.* - (i) දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත 2019 නොවැම්බර් මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත 2019 නොවැම්බර් මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2019 දෙසැම්බර් මස 20 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 දෙසැම්බර් මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## සිවිල් නඩු විධාන සංග්‍රහයේ 255 වැනි වගන්තියට අනුව පිස්කල් විසින් කරනු ලබන පිස්කල් විකිණීම

කුලියාපිටිය දිසා අධිකරණයේ දී ය

1994 අංක 9 දරන පනත මගින් සංශෝධිත 1990 අංක 2 දරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ සහ එය ප්‍රකාරව නෙසයි තීන්දුවක් සහ නියත තීන්දුවක් ලබා ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීමයි.

සෙලාන් බැන්ක්, පීඑල්සී,
සෙලාන් ටවර්ස්, අංක 90, ගාලු පාර, කොළඹ 03.
අංක 137, හෙට්ටිපොල පාර, කුලියාපිටිය දරන ස්ථානයෙහි ශාඛා කාර්යාලයක් පවත්වාගෙන යනු ලබයි.

නඩු අංකය : 17/16/DR
ස්වභාවය : මුදල්
වටිනාකම : රු. 6,849,114.19
ඇස්කිසි අංකය : 48/2019

.........................*පැමිණිලිකරු.*

*එදිරිව*

01. මුතුකුඩ ආරච්චිලාගේ දොන් සුරංග දිල්රුක්
02. තෙන්නකෝන් මුදියන්සේලාගේ රුවනිකා සජීවනි කරුණානායක

*දෙදෙනාම*

අංක 308/24 බී, ආනන්දගිරි උද්‍යානය, කුලියාපිටිය.

..............................*විත්තිකරු.*

කුලියාපිටිය දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2017 ක්වූ සැප්තැම්බර් මස 25 වැනි දින ඇතුළත් කරන ලද නියත තීන්දු ප්‍රකාශයට අනුව එහි පැමිණිලිකරු විසින් විත්තිකරුවන්ගෙන් අයකර ගැනීමට ඇති රුපියල් 6,849,114.19ක මුදල සහ රු. 3,486,453.58ක මුදල මත 2016.05.12 දින සිට සම්පූර්ණයෙන් ගෙවා අවසන්වන දින තෙක් වර්ෂයකට 11% බැගින් වන පොළියද, ගාස්තු ද ගෙවිය යුතු බවට ආඥාකොට ඇති හෙයින්, එය ගෙවීමට විත්තිකරුවන් අපොහොසත් වූ හෙයින්, දැනටමත් තහනමට ගෙන ඇති මෙහි පහත සඳහන් දේපළ පිස්කල් වෙන්දේසියේ විකුණා පැමිණිලිකාර බැංකුවට අයකර දීම සඳහා,

**වර්ෂ 2019 ක් වූ දෙසැම්බර් මස 19 වැනි දින පෙ. ව. 11.00ට එම දේපළ පිහිටි ආනන්දගිරි උද්‍යානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ**

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ දකුණු කටුගම්පල් කෝරළේ, කටුගම්පල් හත්පත්තුවේ, උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පට්ගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පට්ගමුව ගමේ පිහිටි, රාගම එස්ටේට් නමැති ඉඩමට (බලයලත් මානක එම්. ජේ. ගෝමස් විසින් මැන සාදන ලද පිඹුරෙහි නිරූපිත ලොට් 1 දරන බිම් කොටස නැවත බෙදීමක් අනුව) බලයලත් මිනින්දෝරු එම්. ජේ. ගෝමස් විසින් මැන සාදන ලද අංක 7125 සඳහා වර්ෂ 2005.03.13 වැනි දින දරන පිඹුරෙහි නිරූපිත ලොට් 1බී දරන බිම් කොටස සඳහා මායිම්,

උතුරට : ඉහත කී පිඹුරු අංක 7125 හි ලොට් 1 ඒ ද,
නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එම්. ජේ. ගෝමස් විසින් මැන සකසන ලද පිඹුරේ අංක 6639 හි ලොට් බී ද,
දකුණට : ඉහත කී පිඹුරු අංක 7125 හි ලොට් 2 ද,
බස්නාහිරට : ප්‍රධාන පාරේ සිට හේනේගෙදර දක්වා යන ප්‍රාදේශීය සභා පාර ද,

යන මායිම් තුළ වූ රූඩ් දෙකක (අ.0, රූ.2, පර්.0) විශාලත්වයෙන් යුතු බිම් කොටස සහ ඒ තුළ පිහිටි පස, ගස්, වැවිලි ඇතුළු සියළු දේද වේ.

මෙම ඉඩම කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K 208/172හි ලියාපදිංචි වී ඇත.

*දේපළට ප්‍රවේශ මාර්ගය.-* මාදම්පේ හන්දියේ සිට කුලියාපිටිය පාරෙන් 50km, කණුව පසුකර මීටර් 400ක් පලුගම හන්දිය දක්වා පැමිණ තවත් මීටර් 400ක් ඉදිරියට ගොස් දකුණට ඇති ජිනගෙදර පාරෙන් මීටර් 600ක් ගියවිට වම් පසින් වන්නට මෙම විෂයගත දේපළ පිහිටා ඇත.

*ගෙවීම් ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේදී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

01. ගැණුම් මිලෙන් 25%,
02. පළාත් අධිකාරියේ බදු සඳහා 1%,
03. ප්‍රචාරණ වියදම්

ගැණුම් මිලෙන් 75%ක් වූ ඉතිරියද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත කුලියාපිටිය දිසා අධිකරණයේදී ඉහත නඩු අංකය යටතේ බැර කළ යුතුය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

තව ද, ගැණුම්කරු විසින් තමන්ගේ අනන්‍යතාවය විධිමත් අයුරින් ඉදිරිපත් කළ යුතුය.

තව ද, මෙම විකිණීම සම්බන්ධ යම් විරෝධතාවක් වෙතොත් දින 30ක් ඇතුළත මෙම අධිකරණයට ඉදිරිපත් කළ යුතුය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න : ප්‍රධාන කළමණාකරු නීති, සෙලාන් බැන්ක් පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03.

011-2456485, 011 2456479.

එච්. පී. ඩී. අබේරත්න,
රෙජිස්ට්‍රාර්/ නියෝජ්‍ය පිස්කල්,
සාම විනිසුරු,
දිසා අධිකරණය, කුලියාපිටිය.

11-1670

---

# නොතාරිස් ලැයිස්තුව

## දැන්වීමයි

### 107 අධිකාරය වන නොතාරිස් ආඥාපනත

කොළඹ මහාධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධූරයේ කටයුතු කළ පෙට්ටගම් සැම්සන් විජේපාල මහතා 2019.02.28 දින සිට ධූරයෙන් ඉල්ලා අස්වීම ගරු අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා සහ පලාත් පාලන ඇමතිතුමා විසින් අනුමත කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න,
ලේකම්,
අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය.

2019 අගෝස්තු මස 22 වැනි දින,
කොළඹ දී ය.

11-1612

---

## දැන්වීමයි

### 107 අධිකාරය වන නොතාරිස් ආඥාපනත

ගම්පහ මහාධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් නොතාරිස් ධූරයේ කටයුතු කළ හඳගිරිපතිර මොහොට්ටාලලාගේ රංජිත් ජයසිරි පතිරත්න මහතා 2019.02.28 දින සිට ධූරයෙන් ඉල්ලා අස්වීම ගරු අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා සහ පළාත් පාලන ඇමතිතුමා විසින් අනුමත කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න,
ලේකම්,
අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය.

2019 අගෝස්තු මස 22 වැනි දින,
කොළඹ දී ය.

11-1613

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.